**ශීර්ෂය - 6 රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**-----------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

---------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 08 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප විය.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 2021/03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 දරන චක්‍රලේඛයේ 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් එකතු කරන ලද ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකළ යුතු අතර එම ආදායම අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපිම් කළ යුතු වේ. එහෙත් කොමිෂන් සභාව විසින් රු.12,083,607 ක්වූ එම ආදායම වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල මෙම ගැලපීම නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) **දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්විය යුතු දේපළ පිරියත උපකරණයන්හි වටිනාකම හා ශුද්ධ වත්කම් යටතේ දැක්විය යුතු දේපළ පිරියත උපකරණ සංචිතයන්හි වටිනාකම රු.854,117.343 ක් වුවත් කොමිෂන් සභාව විසින් මූල්‍ය ප්‍රකාශනයේ එය රු.815,117,344 ක් ලෙස දක්වා තිබුණි. | වාහන පවරා දීම හා පවරා ගැනීම 2021.12.31 දින වන විට සිදු වුවත් නිකුත් කිරීම් නියෝග හා ලැබීම් නියෝග ලැබී නොතිබීම හේතුවෙන් 2021 මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම් කර නොතිබුණි. | වාහන පවරා දීම හා පවරා ගැනීම සිදු කල විගස නිකුත් කිරීම් නියෝග හා ලැබීම් නියෝග ලබාගෙන නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

(ආ) **සීමා ඉක්මවීම**

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සීමා ඉක්මවීම් සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2020 අංක 07 දරන විසර්ජන පනතින් ගිණුම් අංක 00601 සඳහා බලය දෙනු ලැබූ උපරිම හර ශේෂ සීමාව රු.38,000,000 ක් වුවත් තථ්‍ය උපරිම හර ශේෂය රු. 41,763,063 ක් බැවින් රු.3,763,063 ක උපරිම හර ශේෂ සීමා ඉක්මවා තිබුණු අතර එම උපරිම හර ශේෂ සීමාව සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි. | උපරිම හර සීමාව රු. 43,000,000 දක්වා සංශෝධනය කර දෙන ලෙස 2021.11.30 දිනැති අංක PSC/ACC R04/01/03/2021 ලිපියෙන් ඉල්ලා ඇත. එම ලිපිය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද බව දන්වා අයවැය දෙපාර්තමේන්තුව වෙතින් BD/AA/LR/01/2022 අංක දරන 2021.12.31 දිනැති ලිපියෙන් දන්වා ඇත. | උපරිම හර සීමාව ඉක්ම නොවිය යුතුය. නැතහෙත් සීමාවන් සංශෝධනය සඳහා අනුමැතිය ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන් දීමේ නිලධාරියා විශේෂයෙන් වග බලා ගත යුතු වුවත්, කොමිෂන් සභාව විසින් 2104 වැය විෂයය යටතේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 77 ක් එනම් රු.385,380 ක්ද, 2102 වැය විෂයය යටතේ ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් එනම් රු.649,768 ක්ද හා 1404 වැය විෂයය යටතේ බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් එනම් රු.223,157 ක්ද වැය නොකර වර්ෂ අවසානයේ ඉතිරිව පැවති අතර මෙම ඉතිරිවීම් සඳහා භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස් කිරීම සීමා කිරීමද හේතුවී තිබුණි. | ආයතනික මූලධන වියදම් හැකිතාක් දුරට සීමා කිරීම යටතේ භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස් කිරීම සීමා කරන ලද බැවින් 2104 වැය විෂයය යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට හැකියාවක් නොතිබුණි. ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු නිමකර 2021.11.19 දින ඇණවුම් කළද නිසි කලට භාණ්ඩ සපයා නොතිබීම හේතුවෙන් 2102 වැය විෂයයේ ප්‍රතිපාදන ඉතිරි විය.<br>කාර්යාල ගොඩනැගිල්ලට අදාල අනුකූලතා සහතිකය ලබා දීම 2022.02.22 දින සිදු වීම හේතුවෙන් 1404 වැය ශීර්ෂය යටතේ වූ ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ ආයතන අංශය, විනය අංශය, පත්කිරීම් අංශය හා උසස් කිරීම් අංශය විසින් සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් සංඛ්‍යාව පමණක් වාර්තාවේ ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල අංශයට ලැබුණු පැමිණිලි (කාර්යයන්) සංඛ්‍යාව, එම පැමිණිලි (කාර්යයන්) තුලින් නිම කළ ප්‍රමාණය සහ තවදුරටත් ඉතිරිව පවතින ප්‍රමාණය යන තොරතුරු ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව අදාල වාර්තාව තුල සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු වාර්තාව තුල ඇතුළත් කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අභියාචන අංශයට ලැබුණු අභියාචනා ප්‍රමාණය ප්‍රමාණාත්මකව දක්වා තිබුණද, නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවූ අභියාචනා ගණන සහ කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය ඉදිරිපත් කිරීමේදී එය සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයන්හි අභියාචනා ප්‍රමාණයද ඇතුළත්ව ඉදිරිපත් කර තිබුණි. එම හේතුවෙන් එම අංශයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන මට්ටම නිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අභියාචනා අංශයට ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් වාර්තා කැඳවුවද එකී වර්ෂය තුලම එම වාර්තා නොලැබෙන බව නිරීක්ෂණය කරන අතර, එම හේතුව මත සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය මැන බලන්නේ නම් එම වාර්තා ලබා දීමට වෙනත් රාජ්‍ය ආයතන ගතකරන කාලය මත කාර්යසාධනය තීරණය වන බව නිරීක්ෂණය කරමි. | වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු වාර්තාව තුල ඉදිරිපත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අධ්‍යාපන සේවා කමිටුව හා සෞඛ්‍ය සේවා කමිටුව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව සිදු කළ කාර්යයන් ප්‍රමාණය පමණක් වාර්තාවේ දක්වා තිබුණි. අදාල කමිටු වෙත සමාලෝචිත වර්ෂයේ ලැබුණු කාර්යයන් හා ඒවායින් සමාලෝචිත වර්ෂයේදී නිම කළ කාර්යන් පිළිබඳව තොරතුරු වාර්තාවේ දක්වා නොතිබුණි. තවද පෙර වර්ෂවල සිට පැමිණෙන කාර්යයන් හා වර්ෂය අවසානයේ ඉතිරිව ඇති කාර්යයන්ද එම කාර්යන්හි කාල විශ්ලේෂණයක්ද වාර්තාවේ ඉදිරිපත් නොවීම තුලින් අදාල අංශයේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | සෞඛ්‍ය සේවා කමිමුවට අදාලව පමණක් සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ලිපි 367ක් පැවතුණි. ලිපි 5264ක් වර්ෂය තුල ලද අතර ලිපි 5477ක් සඳහා වර්ෂය තුල කටයුතු කර තිබුණි. | වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු වාර්තාව තුල ඉදිරිපත් කල යුතුය. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව සතු වාහන 02ක් වර්ෂය පුරා ධාවනය කිරීමකින් තොරව පැවති අතර එම වාහනවල නඩත්තු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.37,315 ක්වැය කර තිබුණි. | වාහන 02 අලුත්වැඩියාවන් සඳහා යොමුකර ඇත. | වත්කම් පූර්ණ වශයෙන් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | 2017 ජූලි 25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2017 ප්‍රකාරව අවසන් ප්‍රතිඵලයන් හා ගලපන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක | අංක 2004/49 හා 2017.02.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුකූලව මෙම කමිටුව වෙත පැවරී ඇති රාජකාරී වල ස්වභාවය අනුව, | චක්‍රලේඛ ප්‍රකාරව කාර්යසාධන දර්ශක හඳුනා ගත යුතුය. |

| | |
|---|---|
| (KPIS) සකස් කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් කාර්ය සාධන දර්ශක හදුනාගෙන නොතිබුණි | සෑම විටම කාර්යසාධනය පදනම් වනුයේ අදාල රේඛීය අමාත්‍යාංශය විසින් කමිටුව වෙත යොමු කරනු ලබන කාර්යය ප්‍රමාණය මත වන බැවින් ප්‍රධාන කාර්යසාධන දර්ශක, වර්ෂය ආරම්භයේදී සකස් කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැක. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

\-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව තිරසර සංවර්ධන අරමුණු, ජාතික සංවර්ධන උපායමාර්ග සමග එක්ව පෙළ ගැස්වීම සිදු කල යුතු වුවත් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති කාර්යසාධන වාර්තාව තුල තිරසාර සංවර්ධන අරමුණු අදාල නොවේ යනුවෙන් සඳහන් කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම මෙම කොමිෂන් සභාවට සෘජුවම අදාළ කර ගැනීම ප්‍රායෝගික නොවේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

\-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක්, තෘතීය මට්ටමේ තනතුරු 05 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | නීති නිලධාරී බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කටයුතු යොදා ඇත.<br>පරිපාලන සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින තනතුරු දෙකක් වැඩ ආවරණය සඳහා නිලධාරීන් පත්කර ඇති අතර, | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

පුරප්පාඩුව පවතින අනෙක් තනතුරු සඳහා නවක බඳවා ගැනීම් වලින් නිලධාරීන් අනුයක්ත කරන ලෙස දන්වා ඇත. තොරතුරු හා සන්නිවේදන සහකාර අධ්‍යක්ෂක ධූරයටද වැඩබැලීමේ නිලධාරියෙකු පත්කර ඇත. තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු අනුයුක්ත කර ගැනීමට කටයුතු යොදා ඇත.